# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2102/23 - 2018 දෙසැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2018.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* RPDS/LND/09/ACQ/15/(CEB).
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/2/2016/CEB/401.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපත්තුව සුළු කොට්ඨාසයේ 164 ගල්ලෑල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුගේපොල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අ.ග.පි. 406 පිඹුරේ කැබලි අංක 377 වන පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල වේ.

01. **කැබලි අංක 377**

ඉඩමේ නම: ගලබොඩවත්ත; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; හිමිකම් කියන්නා: හපුගස්තැන්න වැවිලි සමාගම, අංක 95/ඒ, නම්බපාන, ඉංගිරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 1.4489.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට රත්නපුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 පෙබරවාරි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි. ආර්. එම්. ප්‍රදීපිකා ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රත්නපුර,
2018 දෙසැම්බර් මස 12 වැනි දින.

01- 40

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29114 – 17 (2018/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.